
# තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය

## 1.2. තර්ක ශාස්ත්‍රය හා වෙනත් විෂයයන් අතර ඇති සම්බන්ධතාව ප්‍රදර්ශනය කරයි.





Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

## ඉගෙනුම් පල

1. තර්ක ශාස්ත්‍රය හා අනෙකුත් විෂයයන් අතර ඇති සම්බන්ධතා විග්‍රහ කරයි.

2. තර්ක ශාස්ත්‍රය අනෙකුත් විෂයයන්ට ප්‍රායෝගිකව යොදා ගත හැකි ආකාරය විග්‍රහ කරයි.



Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය සකස් කිරීම : ප්‍රීතිමා සෙනෙවිරත්න මිය, කෑ/ශාන්ත ජෝසප් බාලිකා විද්‍යාලය,කෑගල්ල .
පරිගණක පිටු සැකසුම : ජී.ඩී.සී.එන්.ගමගේ මෙය, මො/මහානාම මධ්‍ය මහා විද්‍යාලය,මොනරාගල.
අන්තර්ගතය පරීක්ෂා කිරීම : කථිකාචාර්ය තරංග ධරණීත මයා, දර්ශන අධ්‍යයනාංශය, කැලණිය වි.වි
Copyright © www.e-thaksalawa.moe.gov.lk

# තර්ක ශාස්ත්‍රය හා වෙනත් විෂයයන් අතර ඇති සම්බන්ධතාවය

## තර්ක ශාස්ත්‍රය හා දර්ශනය

දර්ශනය මූලික වශයෙන් විචාරශීලි බව හා යථාර්ථය මත පදනම් ඥානමූලික අධ්‍යයනයක් වෙයි. දර්ශනය හා සම්බන්ධ ඥාන විභාගය, ආචාරධර්ම හා පාරභෞතිකවාදය යන ක්ෂේත්‍රයන්හි තාර්කික බව උදෙසා තර්ක ශාස්ත්‍රය වැදගත් උපක්ෂේත්‍රයක් වේ.

ඕනෑම දර්ශනයක් තුළ තාර්කික විශ්ලේෂණ ක්‍රමයක් දැකගත හැකිවේ.

අතීතයේ සිට අද දක්වා තර්ක ශාස්ත්‍රය දර්ශන විෂයේ අංශයකි. තර්ක ශාස්ත්‍රය මඟින් සප්‍රමාණ චින්තනයට අවශ්‍ය මූලධර්ම ගොඩනගයි. දාර්ශනික විග්‍රහයන් සියල්ල කෙරෙහි තර්කනය එක ලෙස බලපෑනු ලබයි.

චින්තනය මනසට අයත් වුවත් එය බැහැරට ප්‍රකාශ කරන්නේ භාෂාව මඟිනි.සමකාලීන දාර්ශනිකයන් (විට්ගන්ස්ටෛන් වැනි) පවසන ආකාරයට දාර්ශනික ගැටලු බොහොමයක් උද්ගතව ඇත්තේ භාෂාව හේතුවෙනි. එම නිසා භාෂාමය ගැටලු නිරාකරණය තුලින් දාර්ශනික ගැටලු විසඳා ගත හැක. මෙහිදී තාර්කික විශ්ලේෂණය ඇසුරෙන් මේ ගැටලු නිරාකරණය කර ගත හැකිය. තර්කනයෙන් පරිබාහිර වූ කල්හි දාර්ශනික පද්ධතීන් දුර්වල හා ව්‍යාකූල වෙයි. ඒ අනුව තාර්කික විශ්ලේෂණය දර්ශනය තුළදීත් හැදෑරේ.

## තර්ක ශාස්ත්‍රය හා විද්‍යාව

විද්‍යාව නම් ප්‍රපංච ලෝකය පිළිබඳ ක්‍රමානුකූල හා වාස්තවික ඥාන සම්භාරයක් ගොඩ නඟනු ලබන විෂයයක් සේ සැලකේ. ඉන් දැනුම හා විමර්ශනය යන්න අර්ථවත් වේ. මූලික වශයෙන් විද්‍යාත්මක ක්‍රමය මත පදනම් වේ. තාර්කික අනුමානයේ ප්‍රධාන ස්වරූපයන් දෙක වන නිගාමී හා උද්ගාමී බව විද්‍යාත්මක විධිවේදයට සෘජු ලෙස බලපායි.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය සකස් කිරීම : ප්‍රීතිමා සෙනෙවිරත්න මිය, කෑ/ශාන්ත ජෝසප් බාලිකා විද්‍යාලය,කෑගල්ල .
පරිගණක පිටු සැකසුම : ජී.ඩී.සී.එන්.ගමගේ මෙය, මො/මහානාම මධ්‍ය මහා විද්‍යාලය,මොනරාගල.
අන්තර්ගතය පරීක්ෂා කිරීම : කථිකාචාර්ය තරංග ධරණිත මයා, දර්ශන අධ්‍යයනාංශය, කැලණිය වි.වි
Copyright © www.e-thaksalawa.moe.gov.lk

## තර්ක ශාස්ත්‍රය හා මනෝවිද්‍යාව

මෙම විෂයයන් දෙකම බොහෝ කලක සිට දර්ශනය විෂයේ අංශ ලෙස පැවතුනද පසුකාලීනව මනෝ විද්‍යාව දර්ශනයෙන් වෙන්ව ස්වාධීන විෂයයක් ලෙස වර්ධනය විය.

මනෝ විද්‍යාව මිනිස් සිතෙහි ස්වභාවයත් එහි ක්‍රියාකාරීත්වයත් අධ්‍යයනය කරයි. චින්තනය හා වින්දනය පිළිබඳවත්, චින්තනය හා සංජානනය පිළිබඳවත් කෙරෙන මත විමසුම්හිදී තාර්කික ගම්‍යයන් කරා අප සිතුවිලි මෙහෙයවීමට තර්කනය අවශ්‍ය සාධකයක් වේ. මීට අමතරව තර්කය සප්‍රමාණ චින්තනයකට අවශ්‍ය කරුණු පිළිබඳ විමසිලිමත් වෙයි. එබැවින් අප සිතන්නේ කෙසේද යන කාරණයට වඩා අප නිවැරදිව සිතිය යුත්තේ කෙසේද යන කාරණය කෙරෙහි තර්කනය උනන්දු වෙයි.

මනෝවිද්‍යාඥයා මානසික සිදුවීම් අතර ඇති හේතුඵල සම්බන්ධතාව විසඳයි.තර්ක ශාස්ත්‍රඥයා දී ඇති අවයව/සාක්ෂි තුළින් අවශ්‍යයෙන්ම ගම්‍ය වන නිගමනයන් ඇත්දැයි සොයා බලයි. චින්තනය පිළිබඳව මනෝවිද්‍යාවේ දී හැදැරෙන අතර එහි සප්‍රමාණතාවය පිළිබඳව තර්ක ශාස්ත්‍රඥයා හදාරයි.

## තර්ක ශාස්ත්‍රය හා ගණිතය

තර්ක ශාස්ත්‍රය ගණිතයෙහි දිගුවක් ලෙස සැලකිය හැකිය.මේවා මූලික වශයෙන් නිගාමී රූපික පද්ධතීන් ලෙස සැලකේ. වියුක්තකරණයකට මෙන්ම සාධාරණීකරණයකටද ලක් කරමින් දැනුම ගොඩ නඟයි.

මෙම විෂයයන් දෙකම බුද්ධිය පමණක් ඥානාශ්‍ර කරගනී.ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයන්ගෙන් තොර වියුක්ත සංකල්ප හැදෑරීමට ලක්වේ. සංකේතමය ක්‍රමය තර්ක ශාස්ත්‍රයට ඇතුළත් වූයේ ගණිතයෙනි.එමඟින් තර්ක ශාස්ත්‍රයේ භාෂාව පාරිභාෂික අර්ථයක් ගනු ලැබීය.අද සංකේතමය භාෂාව විශ්ව සාධාරණ පොදු භාෂාවක් ලෙස හඳුන්වයි. ලයිබ්නීස් වැනි අය ගණිතය යොදා ගන්නා නිගාමී ක්‍රමය තර්ක ශාස්ත්‍රයට සම්බන්ධ කිරීමට උත්සහ දැරීය.ජෝර්ජ් බූලේ හා ඔගස්ටස් ද මෝර්ගන් වැනි අය වීජ ගණිතමය ස්වරූපයන් තර්ක ශාස්ත්‍රයට ප්‍රචලිත කළේය. ෆ්‍රෙග් ස්වසිද්ධිමය ක්‍රමය තර්ක ශාස්ත්‍රයෙහි අධ්‍යයනයන්ට යොදා ගැනීමට උත්සහ දැරීය.අනෙක් අතට ජෝන් වෙන් නැමැත්තා තාර්කික විශ්ලේෂණ ක්‍රමය යොදා ගත් කුලකවාදය අද ගණිතයෙන් ඉතා පුළුල්ව මෙන්ම බලය අතින්ද ප්‍රමුඛ වේ. රසල් හා වයිට්හෙඩ් රචනා කළ ග්‍රන්ථවල ගණිතය තාර්කික පදනමක් තුළ ගොඩනැගූ පද්ධතියක් ලෙස දැක්වීමට උත්සහ ගත්තේය. ඒ අනුව මෙම විෂයයන් දෙක එකිනෙක සහයෙන් කාලයක් තිස්සේ වර්ධනය විය.

අන්තර්ගතය සකස් කිරීම : ප්‍රීතිමා සෙනෙවිරත්න මිය, කෑ/ශාන්ත ජෝසප් බාලිකා විද්‍යාලය,කෑගල්ල .

පරිගණක පිටු සැකසුම : ජී.ඩී.සී.එන්.ගමගේ මෙය, මො/මහානාම මධ්‍ය මහා විද්‍යාලය,මොනරාගල.

අන්තර්ගතය පරීක්ෂා කිරීම : කථිකාචාර්ය තරංග ධරණීත මයා, දර්ශන අධ්‍යයනාංශය, කැලණිය වි.වි

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## තර්ක ශාස්ත්‍රය හා පරිගණක විද්‍යාව

පරිගණක ආශ්‍රිත මෘදුකාංග හා දෘඪාංග තාක්ෂණය මූලික වශයෙන් තාර්කික සංකල්ප මත පදනම් වේ. පරිගණකයේ දෘඪාංග තාක්ෂණයට පාදක වන අනුකලිත පරිපථයන්හි සැකසුම තාර්කික ද්වාර මත ගොඩ නැගේ.එසේම මෘදුකාංග ඇසුරෙහි සැකසෙන ක්‍රමලේඛ නැතහොත් ගැලීම් සටහන් ද තර්කන රටා මත නිර්මාණය වේ.

## තර්ක ශාස්ත්‍රය හා නීතිය

නෛතික කාරණා තාර්කික බව පදනම්ව ගොඩ නැඟෙයි. නීති මූලාශ්‍ර, නීතියේ ස්වභාවය හා නීති වර්ග පිළිබඳ විමසීමේදී ඒ බැව් තහවුරු වේ.සාක්ෂීන් ඔස්සේ තාර්කික අනුමාන කරා ප්‍රවේශ වීමද නීතිය මඟින් සිදුවේ.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය සකස් කිරීම : ප්‍රීතිමා සෙනෙවිරත්න මිය, කෑ/ශාන්ත ජෝසප් බාලිකා විද්‍යාලය,කෑගල්ල .
පරිගණක පිටු සැකසුම : ජී.ඩී.සී.එන්.ගමගේ මෙය, මො/මහානාම මධ්‍ය මහා විද්‍යාලය,මොනරාගල.
අන්තර්ගතය පරීක්ෂා කිරීම : කථිකාචාර්ය තරංග ධරණිත මයා, දර්ශන අධ්‍යයනාංශය, කැලණිය වි.වි
Copyright © www.e-thaksalawa.moe.gov.lk